# 14 සංඛ්‍යා පාද

## 14-1 දහයේ පාදයේ සංඛ්‍යා පද්ධතිය

අපි එදිනෙදා භාවිත කරන 0 සිට 9 තෙක් ඉලක්කම් 10 සහිත හින්දු අරාබි සංඛ්‍යාංකණ පද්ධතිය පාදය දහය වූ සංඛ්‍යාංකණ ක්‍රමය හෙවත් දශමය සංඛ්‍යාංකන ක්‍රමය ලෙස හැඳින්වෙයි.

දහයේ පාදයේ සංඛ්‍යා පද්ධතිය පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ.

❉ දහයේ පාදයේ සංඛ්‍යා පද්ධතියේ ඉලක්කම් කුලකය
$\{0, 1, 2, 3, 4, 5, 6, 7, 8, 9\}$

මෙම ඉලක්කම් භාවිත කර ලියනු ලබන සංඛ්‍යාංකණයනගේ ඉලක්කම්වල ඇති වටිනාකම් ගණක රාමුවක් මගින් පැහැදිලි කර ගනිමු.




රූපසටහන ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඕනෑ ම කුරක තිබිය හැකි උපරිම ගණක සංඛ්‍යාව කීය ද?

(ii) B කුරේ ගණකයක් නිරූපණය කරන සංඛ්‍යාව C කුරේ ගණකයකින් නිරූපණය වන සංඛ්‍යාව මෙන් කී ගුණයක් ද?

(iii) B කුරෙන් නිරූපණය වන වටිනාකම කීය ද?

(iv) ඉහත ගණක රාමුවෙන් නිරූපණය කර ඇති සංඛ්‍යාංකය කුමක් ද?

(v) මෙවැනි ගණක රාමුවකින් බිංදුව නිරූපණය කරන්නේ කෙසේ ද?

**පිළිතුරු** (i) 9යි (ii) දස ගුණයකි
(iii) 300යි. (iv) 2342
(v) එකම ගණකයක්වත් අදාල කුරට නොදමා 0 නිරූපණය කළ හැකි ය.

## 14-2 දෙකේ පාදයේ සංඛ්‍යා හෙවත් ද්විමය සංඛ්‍යා

0 හා 1 යන ඉලක්කම් දෙක පමණක් භාවිත කරමින් ලියනු ලබන සංඛ්‍යා පද්ධතිය ද්විමය සංඛ්‍යා පද්ධතිය නමින් හැඳින්වේ.

∴ ද්විමය සංඛ්‍යා පද්ධතියේ ඉලක්කම් කුලකය $= \{0, 1\}$

**එබැවින් ද්විමය සංඛ්‍යාවල ලිවිය හැකි විශාල ම ඉලක්කම 1 වේ.**

ද්විමය සංඛ්‍යා ගණක රාමුවකින් නිරූපණය කරමු.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**නිදසුන (1)** $1101_{දෙක}$




> දහයේ පාදයේ සංඛ්‍යාවක පාදය දහය යනුවෙන් ලියනු නොලැබුවත් දෙකේ පාදයේ සංඛ්‍යාවක පාදය දෙක යනුවෙන් සඳහන් කිරීම සම්මත ක්‍රමයයි.

## ක්‍රියාකාරකම (1)




දෙකේ පාදයේ සංඛ්‍යා නිරූපණය කරන ඉහත ගණක රාමුව සැලකිල්ලට ගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දෙකේ පාදයේ ගණක රාමුවක ඕනෑ ම කුරක තිබිය හැකි උපරිම ගණක ගණන කීය ද?

(ii) C කුරේ ඇති ගණකයකින් නිරූපණය වන සංඛ්‍යා B කුරේ ඇති ගණකයකින් නිරූපණය වන සංඛ්‍යාව මෙන් කී ගුණයක් ද?

(iii) මෙම ගණක රාමුවේ D කුරේ සහ B කුරේ ගණක 1 බැගින් තිබේ නම් එම ගණක රාමුවෙන් නිරූපණය කෙරෙන සංඛ්‍යාව කීය ද?

**පිළිතුරු**

(i) උපරිම ගණක ගණන 1 කි. (ii) දෙගුණයකි. (iii) $1010_{දෙක}$

### 14-1 අභ්‍යාසය

(1) පහත සඳහන් දෙකේ පාදයේ සංඛ්‍යා ගණක රාමුවලින් නිරූපණය කරන්න.

(i) $1001_{දෙක}$ (ii) $1101_{දෙක}$ (iii) $10111_{දෙක}$ (iv) $1111_{දෙක}$ (v) $10011_{දෙක}$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(2) පහත ඇති ගණක රාමුවලින් නිරූපණය කර ඇති සංඛ්‍යා ලියන්න.

(I)




(II)




(III)




(IV)




## 14-3 දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට පරිවර්තනය

දහයේ පාදයේ සංඛ්‍යා ද්වීමය සංඛ්‍යා බවට පරිවර්තනය කිරීමේ පහසු ම ක්‍රමය නම් දෙන ලද සංඛ්‍යාව දෙකෙන් පුන පුනා බෙදමින් ලබ්ධිය ශූන්‍ය කිරීමයි.

### නිදසුන (2)

$15_{\text{දහය}}$ දෙකේ පාදයේ සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න.




### නිදසුන (3)

$23_{\text{දහය}}$ දෙකේ පාදයේ සංඛ්‍යාවක් ලෙස ලියන්න.




**14-4 අභ්‍යාසය**

(1) පහත සඳහන් දහයේ පාදයේ සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට පරිවර්තනය කරන්න.

(i) 10 (ii) 64 (iii) 85 (iv) 127 (v) 300

## 14-4 ද්විමයසංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්තනය කිරීම.

**නිදසුන (4)** $110_{දෙක}$ දහයේ පාදයට පරිවර්තනය කරන්න.

$1\ 1\ 0_{දෙක}$

$2^0 \rightarrow 1 \times 0 = 0$

$2^1 \rightarrow 2 \times 1 = 2$

$2^2 \rightarrow 4 \times 1 = 4$

$6_{දෙක}$

☛ සංඛ්‍යාවේ ස්ථානීය අගය අනුව ඒ ඒ ඉලක්කම්වල වටිනාකම් ගනිමු.

මෙහි වටිනාකම දහයේ පාදයට පරිවර්තනය කිරීමේ තවත් ක්‍රමයක් ඇත.

$$1\ 1\ 0_{දෙක} = (4 \times 1) + (2 \times 1) + (1 \times 0)$$
$$= 4 + 2 + 0$$
$$= 6_{දහය}$$

එකේ ඒවා
දෙකේ ඒවා
හතරේ ඒවා

**නිදසුන (5)** $11011_{දෙක}$ දහයේ පාදයට පරිවර්තනය කරන්න.

$$1\ 1\ 0\ 1\ 1_{දෙක} = (16 \times 1) + (8 \times 1) + (4 \times 0) + (2 \times 1) + (1 \times 1)$$
$$= 16 + 8 + 0 + 2 + 1$$
$$= 27_{දහය}$$

එකේ ඒවා
දෙකේ ඒවා
හතරේ ඒවා
අටේ ඒවා
දහසයේ ඒවා

**නිදසුන (6)** $111001_{දෙක}$ දහයේ පාදයට පරිවර්තනය කරන්න.

$$111001_{දෙක} = (32 \times 1) + (16 \times 1) + (8 \times 1) + (4 \times 0) + (2 \times 0) + (1 \times 1)$$
$$= 32 + 16 + 8 + 0 + 0 + 1$$
$$= 57_{දහය}$$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**සටහන**

> **සංඛ්‍යා දහයේ පාදයට පරිවර්තනය කිරීමේදී ඊතල යොදා ලිවීම අවශ්‍ය ම නොවන බව මතක තබා ගන්න. ඉහත ආකාරයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි ය.**

**14-5 අභ්‍යාසය**

පහත සඳහන් ද්විමය සංඛ්‍යා දහයේ පාදයෙන් දක්වන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | $100_{\text{දෙක}}$ | (ii) | $101_{\text{දෙක}}$ | (iii) | $111_{\text{දෙක}}$ |
| (iv) | $1001_{\text{දෙක}}$ | (v) | $1110_{\text{දෙක}}$ | (vi) | $111001_{\text{දෙක}}$ |
| (vii) | $11110_{\text{දෙක}}$ | (viii) | $1011_{\text{දෙක}}$ | (ix) | $101010_{\text{දෙක}}$ |
| (x) | $111011_{\text{දෙක}}$ | (xi) | $110011_{\text{දෙක}}$ | (xii) | $100001_{\text{දෙක}}$ |

## 14-5 ද්විමය සංඛ්‍යා ආකලනය

ද්වීමය සංඛ්‍යා ආකලනයේ දී භාවිත වන පහත සඳහන් බන්ධන පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ.

$$0_{\text{දෙක}} + 0_{\text{දෙක}} = 0_{\text{දෙක}}$$
$$0_{\text{දෙක}} + 1_{\text{දෙක}} = 1_{\text{දෙක}}$$
$$1_{\text{දෙක}} + 0_{\text{දෙක}} = 1_{\text{දෙක}}$$
$$1_{\text{දෙක}} + 1_{\text{දෙක}} = 10_{\text{දෙක}}$$

**මතක තබාගත යුතු ඉතා ම වැදගත් බන්ධනය**

$$\begin{array}{r} 1_{\text{දෙක}} \\ +\ 1_{\text{දෙක}} \\ \hline 10_{\text{දෙක}} \end{array}$$

ඒ අනුව දෙකේ පාදයේ සංඛ්‍යා ආකලනය (එකතු කිරීම) සිදු කරන ආකාරය බලමු.

**නිදසුන (7)**

(i)
$$\begin{array}{r} 100_{\text{දෙක}} \\ +\ 11_{\text{දෙක}} \\ \hline 111_{\text{දෙක}} \\ \hline\hline \end{array}$$

(ii)
$$\begin{array}{r} 110_{\text{දෙක}} \\ +\ 101_{\text{දෙක}} \\ \hline 1011_{\text{දෙක}} \\ \hline\hline \end{array}$$

(iii)
$$\begin{array}{r} 111_{\text{දෙක}} \\ +\ 101_{\text{දෙක}} \\ \hline 1100_{\text{දෙක}} \\ \hline\hline \end{array}$$

**14-2 අභ්‍යාසය**

පහත සඳහන් යුගලවල ඓක්‍යය ලබාගන්න.

| | | | |
|---|---|---|---|
| (i) | $100_{\text{දෙක}} + 10_{\text{දෙක}}$ | (vi) | $1101_{\text{දෙක}} + 100_{\text{දෙක}}$ |
| (ii) | $110_{\text{දෙක}} + 10_{\text{දෙක}}$ | (vii) | $1100_{\text{දෙක}} + 100_{\text{දෙක}}$ |

(iii) $110_{දෙක} + 100_{දෙක}$

(iv) $111_{දෙක} + 101_{දෙක}$

(v) $1001_{දෙක} + 10_{දෙක}$

(viii) $10001_{දෙක} + 111_{දෙක}$

(ix) $10011_{දෙක} + 1011_{දෙක}$

(x) $11101_{දෙක} + 1011_{දෙක}$

## 14-6 ද්විමය සංඛ්‍යා ව්‍යාකලනය (අඩුකිරීම)

ද්විමය සංඛ්‍යා ව්‍යාකලනයේ දී භාවිත වන බන්ධන

$0_{දෙක} - 0_{දෙක} = 0_{දෙක}$

$1_{දෙක} - 0_{දෙක} = 1_{දෙක}$

$1_{දෙක} - 1_{දෙක} = 0_{දෙක}$

$10_{දෙක} - 1_{දෙක} = 1_{දෙක}$

ද්විමය සංඛ්‍යා ව්‍යාකලන සිදු වන ආකාරය සලකා බලමු

**නිදසුන (8)**

(i)

$$\begin{array}{r} 111_{දෙක} \\ -\quad 11_{දෙක} \\ \hline 100_{දෙක} \\ \hline\hline \end{array}$$

(ii)

$$\begin{array}{r} 110_{දෙක} \\ -\quad 11_{දෙක} \\ \hline 11_{දෙක} \\ \hline\hline \end{array}$$

(iii)

$$\begin{array}{r} 11001_{දෙක} \\ -\quad 111_{දෙක} \\ \hline 10010_{දෙක} \\ \hline\hline \end{array}$$

(iv) $110001_{දෙක} - 111_{දෙක}$ අඩු කරන්න

$$\begin{array}{r} 110001_{දෙක} \\ -\quad 111_{දෙක} \\ \hline 101010_{දෙක} \\ \hline\hline \end{array}$$

### 14-3 අභ්‍යාසය

පහත සඳහන් ද්විමය සංඛ්‍යා යුගල අඩු කරන්න.

(i) $111_{දෙක} - 10_{දෙක}$

(ii) $1100_{දෙක} - 100_{දෙක}$

(iii) $11101_{දෙක} - 101_{දෙක}$

(iv) $10011_{දෙක} - 100_{දෙක}$

(v) $10001_{දෙක} - 111_{දෙක}$

(vi) $1111_{දෙක} - 1000_{දෙක}$

(vii) $100111_{දෙක} - 1111_{දෙක}$

(viii) $101101_{දෙක} - 101_{දෙක}$

(ix) $110111_{දෙක} - 1011_{දෙක}$

(x) $1001101_{දෙක} - 1011_{දෙක}$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 14-7 වෙනත් පාදවල සංඛ්‍යා

### I. හතරේ පාදයේ සංඛ්‍යා පද්ධතිය

0, 1, 2, 3 යන ඉලක්කම් හතර පමණක් භාවිත කරමින් ලියනු ලබන සංඛ්‍යා හතරේ පාදයේ සංඛ්‍යා යනුවෙන් හැඳින්වේ.

### II. අටේ පාදයේ සංඛ්‍යා පද්ධතිය

0, 1, 2, 3, 4, 5, 6, 7 යන ඉලක්කම් අට භාවිත කරමින් ලියනු ලබන සංඛ්‍යා පද්ධතිය අටේ පාදයේ සංඛ්‍යා ලෙස හැඳින්වේ.

| සංඛ්‍යා පාදය | භාවිතාවන ඉලක්කම් |
|---|---|
| දෙකේ පාදය | 0, 1 |
| තුනේ පාදය | 0, 1, 2 |
| හතරේ පාදය | 0, 1, 2, 3 |
| පහේ පාදය | 0, 1, 2, 3, 4 |
| හයේ පාදය | 0, 1, 2, 3, 4, 5 |
| හතේ පාදය | 0, 1, 2, 3, 4, 5, 6 |
| අටේ පාදය | 0, 1, 2, 3, 4, 5, 6, 7 |
| නමයේ පාදය | 0, 1, 2, 3, 4, 5, 6, 7, 8 |
| දහයේ පාදය | 0, 1, 2, 3, 4, 5, 6, 7, 8, 9 |

මේ ආකාරයට එක් එක් පාදයේ සංඛ්‍යා පද්ධතිවල භාවිත වන ඉලක්කම් කුලක මෙසේ දැක්විය හැකිය.

**නිදසුන (9)**

දහයේ පාදයේ සංඛ්‍යා හැර ඕනෑ ම පාදයක සංඛ්‍යා ලිවීමේ දී එහි පාද සඳහන් කිරීම සම්මත ක්‍රමයයි.

$10111_{\text{දෙක}}$ , $2001_{\text{දෙක}}$ , $2013_{\text{හතර}}$ , $5023_{\text{හය}}$

## 14-8 දශමය සංඛ්‍යා හතරේ පාදයට හා අටේ පාදයට පරිවර්තනය කිරීම.

**නිදසුන (10)**

(I) 24 හතරේ පාදයෙන් දක්වන්න.

```
4|24
4|6  — 0
4|1  — 2
  0  — 1
```

$24_{\text{දහය}} = \underline{\underline{120_{\text{හතර}}}}$

(ii) 38 හතරේ පාදයෙන් දක්වන්න.

```
4|38
4|9  — 2
4|2  — 1
  0  — 2
```

$38_{\text{දහය}} = \underline{\underline{212_{\text{හතර}}}}$



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(iii) 45 අටේ පාදයෙන් දක්වන්න.

$$\begin{array}{r|l} 8 & 45 \\ \hline 8 & 5 \quad -5 \\ \hline & 0 \quad -5 \end{array}$$

$45 = \underline{\underline{55_{අට}}}$

(iv) 98 අටේ පාදයෙන් දක්වන්න.

$$\begin{array}{r|l} 8 & 98 \\ \hline 8 & 12 \quad -2 \\ \hline 8 & 1 \quad -4 \\ \hline & 0 \quad -1 \end{array}$$

$98 = \underline{\underline{142_{අට}}}$

ඉහත නිදසුන් වලට අනුව දහයේ පාදයේ සංඛ්‍යා වෙනත් ඕනෑ ම පාදයක සංඛ්‍යා බවට පහසුවෙන් පරිවර්තනය කිරීමට නම් එම පාදයේ අගයෙන් දහයේ පාදයේ සංඛ්‍යාව බෙදිය යුතු වේ.

## 14-6 අභ්‍යාසය

පහත සඳහන් දශමය සංඛ්‍යා හතරේ පාදයේ සහ අටේ පාදයේ සංඛ්‍යා ලෙස දක්වන්න.

(i) 36 (ii) 48 (iii) 75

(iv) 125 (v) 235 (vi) 253

### සාරාංශය

- දහයේ පාදයේ සංඛ්‍යා පද්ධතියේ ඉලක්කම් කුලකය
  {0, 1, 2, 3, 4, 5, 6, 7, 8, 9}
- ද්විමයසංඛ්‍යා පද්ධතියේ ඉලක්කම් කුලකය {0, 1}
- හතරේ පාදයේ සංඛ්‍යා පද්ධතියේ ඉලක්කම් කුලකය
  {0, 1, 2, 3}
- අටේපාදයේ සංඛ්‍යා පද්ධතියේ ඉලක්කම් කුලකය
  {0, 1, 2, 3, 4, 5, 6, 7}
- ද්විමය සංඛ්‍යා ආකලනයේ දී හා ව්‍යාකලනයේ දී මතක තබා ගත යුතු බන්ධන

| | |
|---|---|
| 0 + 0 = 0 | 0 – 0 = 0 |
| 0 + 1 = 1 | 10 – 1 = 1 |
| 1 + 0 = 1 | 1 – 0 = 1 |
| 1 + 1 = 10 | 1 – 1 = 0 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## මිශ්‍ර අභ්‍යාසය

(1) පහත දැක්වෙන සංඛ්‍යා ගණක රාමුවලින් නිරූපණය කරන්න.

(i) $1101_{\text{දෙක}}$ (ii) $10101_{\text{දෙක}}$ (ii) $11011_{\text{දෙක}}$

(iv) $123_{\text{හතර}}$ (v) $2465_{\text{අට}}$

(2) පහත ඒවා සුළු කර අගය සොයන්න.

(i) $110_{\text{දෙක}} + 1111_{\text{දෙක}} - 101_{\text{දෙක}}$

(ii) $110011_{\text{දෙක}} - 110_{\text{දෙක}} + 1100_{\text{දෙක}}$

(iii) $11101_{\text{දෙක}} + 110_{\text{දෙක}} - 1101_{\text{දෙක}}$

(iv) $110_{\text{දෙක}} + 11110_{\text{දෙක}} - 110_{\text{දෙක}}$

(3) පහත දක්වා ඇති සංඛ්‍යා ඉදිරියෙන් දක්වා ඇති පාදයට පරිවර්තනය කරන්න.

(i) 45 ( දෙකේ පාදයට )

(ii) 64 ( දෙකේ පාදයට )

(iii) 92 ( දෙකේ පාදයට )

(iv) 112 ( දෙකේ පාදයට )

(v) 142 ( දෙකේ පාදයට )

(vi) 152 ( දෙකේ පාදයට )

(4) පහත දැක්වෙන දෙකේ පාදයේ සංඛ්‍යා දහයේ පාදයෙන් දක්වන්න.

(i) $1101_{\text{දෙක}}$

(ii) $1111_{\text{දෙක}}$

(iii) $100011_{\text{දෙක}}$

(iv) $100111_{\text{දෙක}}$

(v) $1100_{\text{දෙක}}$

(vi) $10101_{\text{දෙක}}$

(5) පහත සඳහන් දහයේ පාදයේ සංඛ්‍යා හතරේ පාදයේ සංඛ්‍යා සහ අටේ පාදයේ සංඛ්‍යා බවට පරිවර්තනය කරන්න.

(i) 17 (ii) 32

(iii) 48 (iv) 50

(v) 75